මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **LAE/2025/40**

**2025.04.04**

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

**2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ නියමය ප්‍රකාරව 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා උපරිම වියදම් සීමාව හෙවත් අවසරලත් මුදල**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) විධිවිධාන ප්‍රකාරව ලිඛිත නීතියක් යටතේ පිහිටුවා ඇති සෑම පළාත් පාලන ආයතනයක් සඳහා (ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සහ කල්මුණේ මහා නගර සභාව හැර) සභිකයන් තෝරා පත් කර ගැනීම පිණිස 2025.05.06 දින පවත්වනු ලබන ඡන්ද විමසීමේ දී තරග කරන සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම, ස්වාධීන කණ්ඩායමකටම හා අපේක්ෂකයකුටම 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව එක් එක් පළාත් පාලන ආයතනයේ එක් එක් ඡන්ද කොට්ඨාසයේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කළ හැකි උපරිම වියදම් සීමාව හෙවත් අවසර ලත් මුදල පිළිබඳ තොරතුරු මතු දක්වා ඇත.

1. උක්ත ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන සියලුම පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විමසා විද්‍යාත්මක ගණනය කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම උපරිම වියදම් සීමාවන් තීරණය කර ඇත.

2. ඒ අනුව පළාත් පාලන ආයතන 339 ක් සඳහා අවසරලත් මුදල තීරණය කිරීමේ දී ගණනය කරන ලද ගණනය කිරීමේ කාර්යය සඳහා එක් ඡන්දහිමියෙක් සඳහා වෙන් වූ මුදල රු. 74.00 සිට රු. 160.00 දක්වා වූ පරාසයක වේ.

| පක්ෂය/ කණ්ඩායම/ අපේක්ෂකයා | (I) ගණනය කිරීමේ මුදලින් හිමිවන ප්‍රතිශතය | (II) අවසර ලත් මුදල ගණනය කිරීම |
|---|---|---|
| පළමු (I) නාමයෝජනා පත්‍රයේ අපේක්ෂකයෙකු සඳහා | පළාත් පාලන ආයතනය සඳහා ගණනය කරන ලද, ගණනය කිරීමේ කාර්යය සඳහා වන මුදලින් 50% ක් වූ ප්‍රමාණය | (I) තීරුවෙහි සඳහන් මුදල තරග කරනු ලබන කොට්ඨාසයට අදාළ වලංගු ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාවෙන් ගුණ කිරීමෙන් |
| අතිරේක (II) නාමයෝජනා පත්‍රයේ අපේක්ෂකයෙකු සඳහා | පළාත් පාලන ආයතනය සඳහා ගණනය කරන ලද, ගණනය කිරීමේ කාර්යය සඳහා වන මුදලින් 20% ක් වූ ප්‍රමාණය | (I) තීරුවෙහි සඳහන් මුදල තරග කරනු ලබන පළාත් පාලන ආයතන බලප්‍රදේශයට වලංගු ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාවෙන් ගුණ කිරීමෙන් ලැබෙන සංඛ්‍යාව II ලැයිස්තුවේ අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් බෙදීමෙන් |
| දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් සඳහා | පළාත් පාලන ආයතනය සඳහා ගණනය කරන ලද, ගණනය කිරීමේ කාර්යය සඳහා වන මුදලින් 30% ක් ප්‍රමාණය | (I) තීරුවෙහි සඳහන් මුදල තරග කරනු ලබන පළාත් පාලන ආයතන බලප්‍රදේශයට වලංගු ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාවෙන් ගුණ කිරීමෙන් |

ඒ අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025 සඳහා තරග කරනු ලබන සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම, ස්වාධීන කණ්ඩායමකටම හා අපේක්ෂකයකුටම 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව ගණනය කරන ලද උපරිම වියදම් සීමාවන් 2025.03.23 දිනැති අංක 2428/72 හා 2025.03.28 දිනැති අංක 2429/47 දරන ගැසට් පත්‍රවල පළ කර ඇති බව නිවේදනය කරනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්